# එහෙනං එයා හොඳට එන්ජෝයි කරනවා ඇති!



ආර්ථික විද්‍යා සංකල්පයක් ලෙස "ටයිම් වැලියු ඔෆ් මනි" හෙවත් කාලයත් සමග මුදලේ අගය වෙනස් (අඩු) වෙන ආකාරය ගැන ඉගෙන ගත්තේ පසු කාලයක දී වුව ද, ඒ ගැන ප්‍රායෝගික අත්දැකීම් නම් අපට කුඩා කාලයේ සිටම අසන්නට දකින්නට මෙන්ම අත් විඳින්නට ද ලැබුණි.

"අපේ කාලේ පොල් ගෙඩියක් ශතයයි, ආප්පයක්

**ඒ දිනවල අප පදිංචිව සිටියේ තාත්තා ගේ මහගෙදර නිසා ගෙවල් කුලී යනාදී ප්‍රශ්න නො තිබුණත්, ඒ ආදායමෙන් අප පස් දෙනෙකු ජීවත් වූ ආකාරය නම් ආර්ථික විද්‍යා ටියුෂන්කාරයින්ට හොඳ කේස් ස්ටඩි උදාහරණයක් සපයනු ඇත.**

තුට්ටුවයි!" යනුවෙන් විසිවෙන ශත වර්ෂයේ මුල උපත ලැබූ අපේ ආච්චී ඇතැම් විට කීවා ය. මගේ පියා වර්ෂ එක්දහස් නමසිය තිස් නමයේ දී ගුරු සේවයට බැඳී ඇත්තේ මසකට රුපියල් තිහක් පමණ වූ පඩියකට ය.

රාත්තලක් ශත හැත්තෑ දෙකේ සීනි, ගෙඩියක් (කුණුහරුපයක් නොවේ!) ශත තිස් පහේ පාන්, බෝතලයක් ශත පහළොවේ භූමිතෙල් යනු අප කුඩා කාලයේ බඩු ලයිස්තුවේ අගයන් ය. පිලියන්දලට නුදුරින් අක්කරයක පමණ ඉඩමක් හැටේ දශකයේ අවසන් කාලයේ දී රුපියල් පහළොස් දහසකට අඩුවෙන් මිලට ගත හැකිව තිබුණි.

හැත්තෑවේ දශකයේ අග භාගයේ දී පවා රජයේ ඉංජිනේරු සේවයේ මෙන් ම වෛද්‍ය සේවයේ ද මූලික වැටුප මසකට රුපියල් හත්සියයක් පමණ විය. ගුරු සේවයේ ඉහළම වැටුප් තලයක සිට ඒ කාලයේ විශ්‍රාම ගිය මගේ පියාට විශ්‍රාම වැටුප ලෙස ලැබුණේ ද එවැනි මුදලකි.

අප සැම ඉතා හොඳින් දන්නා පරිදි, කාලයත් සමගම අනිවාර්යෙන් ම බඩු මිල ඉහළ යයි. භාණ්ඩයක හෝ සේවාවක විකුණුම් මිල යනු එය නිපදවීමට හෝ සැපයීමට යෙදවෙන මිනිස් ශ්‍රමය ද, ප්‍රාග්ධනය ද මත නීර්ණය වෙන්නක් නිසා, මිල ඉහළ යාම සහ ආදායම ඉහළ යාම අතර සෘජු සම්බන්ධයක් ඇත.

උදාහරණයක් ලෙස විශ්‍රාම ගොස් වසර තිස් දෙකකට පසු මගේ පියා මිය යන විට ඔහු ලැබූ විශ්‍රාම වැටුප නාමික අගයෙන් තිස් ගුණයකට වඩා වැඩි වී තිබුණි. එදා අපේ ආච්චිලා කඩෙන් ආප්ප කෑ විලස ම, පසු කලෙක අපේ තාත්තලාට ද, අද අපට ද කඩෙන් ආප්ප කෑමට හැකි වී ඇත්තේ එ නිසා ය.

මා මෙලොවට බිහි වූ දින වෙන විට මගේ පියා සිට ඇත්තේ සිය ජීවිතයේ හතළිස් දෙවෙනි වසර ද අවසාන කරමිනි. මෙය ඒ කාලයේ සාමාන්‍ය තත්වයක් වෙන්නට ඇතැයි සිතීමට පවා හැකිවෙන තරමේ උදාහරණ රාශියක් මගේ සම වයසේ අය ගේ දෙමව්පියන් අතරින් සොයා ගත හැකි බව සත්‍යයක් වුවත්, මෙහි එක් දුර්විපාකයක් වූයේ මා එකොළොස්වන ශ්‍රේණියේ සිටිද්දී ම තාත්තාට සිය පනස් අටවන උපන් දිනය ද විශ්‍රාම යෑමට සිදුවීමයි.
මා විශ්ව විද්‍යාලයේ ඉගෙනුම අරඹන කාලය වෙන විට තාත්තා ගේ ආදායම වූයේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම ගන්නා විට ලැබෙන දීමනාව බැංකුවේ ස්ථාවර තැන්පතුවක යෙදූ නිසා ඉන් ලැබෙන ආදායම පමණි.

ඒ දිනවල අප පදිංචිව සිටියේ තාත්තා ගේ මහගෙදර නිසා ගෙවල් කුලී යනාදී ප්‍රශ්න නො තිබුණත්, ඒ ආදායමෙන් අප පස් දෙනෙකු ජීවත් වූ ආකාරය නම් ආර්ථික විද්‍යා ටියුෂන්කාරයින්ට හොඳ කේස් ස්ටඩි උදාහරණයක් සපයනු ඇත.
අපේ පවුලේ ආර්ථික තත්වය සලකා බලන කල, මට කරන්නට තිබුණු අවස්ථානෝචිත ම දේ වූයේ මොරටුව විශ්ව විද්‍යාලය තෝරාගෙන, පිලියන්දල නැන්දා ගේ නිවසේ පදිංචි වී බසයෙන් විශ්ව විද්‍යාලයට යෑමයි. නමුත් ගඟ බඩ පෙම් මග හා බැඳුණු හන්තාන සිහිනයක ඇලී ගැලී සිටි මට අවශ්‍ය වූයේ බොල්ගොඩ ඇලේ පල් ගඳ විඳිමින් අව්වේ වේලෙන්නට නොව මුදු මද නල පහස ලබමින් රොබරෝසියා මල් පියලි මත පා තබන්නටය. එය අසූව දශකයේ මුල් කාලයේ මසකට රුපියල් පන්සීයක් පමණ වියදම් වෙන උගත් මෝඩකමකි.

"උඹ පේරාදෙණියේ පලයං. මං වියදම් කරන්නම්!" තාත්තා කීවේ ය.

මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ඇරඹුණු ඒ මුල් කාලයේ ලබා දුන් ශිෂ්‍යත්ව කිහිපයෙන් එකක් මට නො ලැබුණි. විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට ලබා ගත හැකි බැංකු ණය ක්‍රමයක් තිබුණේ වුව ද, මට ඒ සඳහා සුදුසුකම් නැති බව දන්වන ලදී.

මට කලිසම් කමිස කිහිපයක් මිලට ගෙන දුන් මල්ලිකා පුංචි අම්මා හැම මසකම මට රුපියල් සීයක් දෙන්නට පොරොන්දු වූවා ය. අශෝකා පුංචි අම්මා රුපියල් පන්සීයක් දුන්නා ය. සුනීතා පුංචි අම්මා නොයෙකුත් අඩුම කුඩුම මිළට ගෙන දී මුදල් ද දුන්නා ය. නන්දවතී නැන්දා රුපියල් හත්සීයක් දුන්නා ය. කරුණාවතී නැන්දා ද මුදල් දුන්නා ය. මම පේරාදෙණියේ ගියෙමි.

මුල් දිනයේ සිට ම මම දිනපොතේ එදිනෙදා සිදුවෙන වියදම් ලියූවෙමි. උදෑසන කෑමට පාන් භාගයක්, පරිප්පු සහ තේ කෝප්පයක් නේවාසිකාගාරයේ භෝජනාගාරයෙන් රුපියල් තුනකට මිලට ගත හැකි විය. ප්‍රධාන ආහාර වේලක් සඳහා වැය වුණේ රුපියල් හතරක පමණ මුදලකි. තේ කෝප්පයක් ශත හැටකි. සතියක දත්ත විශ්ලේෂණය කළ මට මාසයක් ගත කිරීමට රුපියල් හාරසීයක් පමණ අවශ්‍ය වෙන බව පෙනී ගියේ ය.

සති අන්තයේ විශ්ව විද්‍යාලයේ නො රැඳී නි-

## අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

වෙසට යෑම යන්න පෙනුණේ, ඇඳුම් සෝදා වේලා ගැනීමට ඇති අවස්ථාවක් ලෙස පමණක් නොව, බස් ගාස්තු සහ පේරාදෙණියේ කෑම වියදම් අතර වෙනස නිසා රුපියල් කීපයක් හෝ ඉතුරු කරගැනීමක් ද ලෙසයි. මල්ලිකා පුංචි අම්මාගෙන් මසකට වරක් ලියුම් කවරයක බහා ලූ රුපියල් සීයේ කොළයක් ලැබෙන සඳ, මසකට රුපියල් හාරසියයක වියදමක් යනු තාත්තාට දරා ගත හැකි වියදමක් විය.

ඒ එදිනෙදා රිකරන්ට් වියදම් ය. විශ්ව විද්‍යාලයේ විවිධ වැඩ කටයුතු සඳහා අවශ්‍ය කැල්කියුලේටර්, ඩ්‍රෝවින් ඉන්ස්ට්‍රූමන්ට්ස් යනාදී කැපිටල් ආම්පන්න මිලට ගැනීම සඳහා ද මුදල් ඇවැසි විය. නැන්දලා, පුංචි අම්මලා දුන් මුදල් මගේ පිහිටට ආවේ එහි දී ය.

මා පේරාදෙණියේ ගත කළ වසර හතරක කාලයේ අවසානය වෙන විට වුවද, මගේ මාසික වියදම රුපියල් පන්සීය ඉක්මවා ගියේ නැත.

මා වසර පහක් මූලික අධ්‍යාපනය ලැබූ අපේ ගම් පෙදෙසේ පිහිටි කොස්සින්න ශ්‍රී සීලානන්ද විදුහලේ මේ කාලය දී සේවය කළ විදුහල්පතිවරයා ද, එහි ම ගුරුවරියක ලෙස සේවය කළ ඔහු ගේ බිරින්දෑ ද, දෙදෙනාම කැලණිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් වූහ. ඒ බව මා දැන ගත්තේ දිනක් යම් කිසි අවශ්‍යතාවකට පාසලට ගොස් ඔවුන් මුණ ගැසී තිබුණු මගේ මවගෙනි. ඒ වෙන විට මා ඒ පාසලේ ඉගෙනීම අවසන් කර හයවෙනි ශ්‍රේණිය සඳහා ගලහිටියාව මධ්‍ය විද්‍යාලට ඇතුළත් වී වසර දොළහකටත් වඩා ගෙවී ගොස් තිබුණි.

විදුහල්පති ගුරු දෙපළ ගේ කාලයට පෙර ඔවුන් ගේ විදුහලේ උගත් ආදී සිසුන් වූ තම පුතුන් ගැන එහි දී මගේ මව ඔවුන්ට පවසා ඇති අතර, ඒ කතා බව දික් වී ඇත්තේ ඒ වෙන විට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ ඉගෙනුම ලැබූ මා පිළිබඳවයි.

"පුතාට කොච්චර විතර මාසෙකට වියදම් වෙනවාද?" ගුරු බිරිඳ මගේ මවගෙන් විමසා ඇත.

මව ගේ පිළිතුර වී ඇත්තේ "දැන් නම් මාසෙකට රුපියල් පන්සීයක් විතර වියදම් වෙනවා" කියායි. බුදු අම්මෝ, එච්චර සල්ලි යනවාද? මායි මගේ මහත්තයායි කැලණි කැම්පස් එකේ ඉගෙන ගන්න කොට නම් අපිට මාසෙකට වියදම් වුණේ රුපියල් දෙසිය පනහක් විතර වගේ. එහෙනම්, ඔයා ගේ ලොකු පුතා පේරාදෙණියේ ගිහින් හොඳට එන්ජෝයි කරනවා ඇති!" ගුරුවරිය අම්මා සමග එසේ පවසා ඇත.

"ටයිම් වැලියු ඔෆ් මනි" වැනි ආර්ථික විද්‍යා සංකල්ප ගැන දැනුම මදකට අමතක කරමු. තමන් ජීවත්වෙන ලෝකය ගැන අංශු මාත්‍රයක හෝ සාමාන්‍ය දැනුමක් ඇති අයෙකු අද දවසේ ජීවන වියදම, අඩු වශයෙන් වසර දහයක් පහළොවක් පැරණි තමන් විශ්ව විද්‍යාලයේ උගත් සමයේ දත්ත සමග සසඳා එවැනි සාහසික ප්‍රකාශයක් කරාවිදැයි සැක සහිත ය. අසූවේ දශකයේ මැද වෙන විට ලංකාවේ ජීවන වියදම ඊට කලින් දශකවලට වඩා සාපේක්ෂව කෙතරම් ඉහළ ගියේ දැයි යන්න ද නො සලකා හැරිය හැකි කරුණක් නොවේ.

සති අන්තයක මා නිවසට පැමිණි මොහොතක අම්මා මේ කතාව මා සමග කීවේ සිනාවෙමිනි. ඒ උපාධිධාරී අමන ගුරුවරිය ගේ දුෂ්ට ප්‍රකාශය මගේ මව එකහෙළා ම ප්‍රතික්ෂේප කර ඇති බව මට වැටහිණි.

සිතට එන සෑම අදහසක් ම අපි ක්‍රියාත්මක නො කරමු. එදා මා ක්‍රියාත්මක නොකර සිතුවිල්ලකට පමණක් සීමා කළේ වුව ද, පසු කලෙක දී එවැනි ම වූ සිතුවිල්ලක් සිතට නැගුණු කවුරුන් හෝ අයෙකු මේ ගුරුවරියට හොඳාකාරයේ පාඩමක් උගන්වන්නට ඇතැයි මම සිතමි.